**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2024**

**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් ලබාගෙන ඇති ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට ලබාගත් කඩ හිමියන්ගෙන් ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු රු.8,922,419 ක කුලිය ඉකුත් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබීම නිවැරදි කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව ගලපනවා වෙනුවට, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි. | අධිකරණයේ නඩු පවරා ඇති කඩ කාමර හිමියන් 03 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂයන් ශේෂපත්‍ර දිනට නිශ්චිතව ගණනය කිරීමේ අපහසුතාවය මත 2023 වර්ෂයේදී හඳුනාගෙන නොතිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ප්‍රකාරව ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමක් ලෙස වර්තමාන මූල්‍ය වර්ෂයන්හි ගැලපීම් සිදු කර ඇත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගැලපීම් සිදු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය ඉදිකල මැණික් කුළුණ ගොඩනැගිල්ලේ කඩ සාප්පු කුලියට දීමේදී සාප්පු 14කට අදාලව අයකරගත් රු.84,565,500 ක් වූ මූලික ලංසු වටිනාකම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව එහි ආර්ථික ප්‍රතිලාභය ලැබෙන කාලය පුරාවට | කඩකාමර 14ක් සඳහා එකවර අයකරන ලද ලංසු වටිනාකම වූ රු.84,565,500 ගිවිසුම් ප්‍රකාරව එකවර අයකරන ලද නැවත නොගෙවන ලංසු ආදායමක් වන අතර ගිවිසුම් ප්‍රකාරව මාසිකව කුලී ආදායම් අය කිරීමත් ශ්‍රී ලංකා ගිණුම් | ගිණුම්කරණ ප්‍රමිති 08 අනුව වර්ෂයේ ආදායම හා ඉදිරියට ලද ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බෙදාහැරිය යුතු වුවද, එසේ හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස හඳුනා ගැනීම නිසා රු.82,655,755 කින් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රමිත 18 යටතේ ගිණුම්ගතකර තිබීමත් හේතුවෙන් කාලපරිච්ඡේදයට අදාළ ආදායමක් ලෙස හඳුනාගෙන ඇත. | |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 හා 79 ඡේද ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන පිරිවැය රු.127,000,741 ක් වූ වත්කම්වල දළ ධාරණ අගය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් ගිණුම්වල සිදුකර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද හා නැවත අගය කරන ලද (Revalue) ජංගම නොවන වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16හි 79(අ) අනුව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිති 16 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන වත්කම්වල දළ ධාරණ අගය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 14 ඡේදයේ සඳහන් සාධක සපුරා නොතිබියදී අධිකාරියට එරෙහිව බාහිර පාර්ශව විසින් පවරා තිබූ නඩු 05කට අදාලව, රු.7,700,000 ක් ගෙවිය යුතු වන්දි ලෙස 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මෙම ඇස්තමේන්තු වරද නිවැරදි නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ලාභය රු.7,700,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, අධිකාරියට එරෙහිව බාහිර පාර්ශව විසින් පවරා ඇති නඩු 06 කට අදාලව ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත වන්දි ලෙස රු.1,029,764,412 ක් පවතින බව අධිකාරියේ නීති නිලධාරී තහවුරු කර තිබුණද ප්‍රමිතියේ 28 ඡේදය ප්‍රකාරව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිරවුල් නොවූ නඩු 5 සඳහා වන්දි ගෙවීමේ අවදානමක් පවතින බවට අධිකාරියේ නීති අංශය මඟින් ලබාගන්නා ලද තහවුරු කිරීම් ලිපිය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට අතීත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස ගෙවීම සඳහා වර්තමාන බැඳීමක් පැවතීම පදනම් කොටගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ප්‍රකාරව රු.7,700,000 ක උපචිත වියදම් වෙන්කිරීම් සිදුකොට ඇත. මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 37 යටතේ අසම්භාව්‍ය බැරකම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම සිදුකර ඇත. | ගිණුම්කරණ ප්‍රමිති 37ට අනුකූලව වෙන්කිරීම් කළ යුතු අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීම් කළ යුතු අතර අනෙකුත් අසම්භාව්‍ය බැරකම් හඳුනාගෙන හෙළිදරව් කළ යුතු තොරතුරු හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලට යාබදව පුද්ගලික සමාගමක් විසින් සිදු කරන ලද ඉදිකිරීමක් හේතුවෙන් අධිකාරියේ පරිශ්‍රයෙන් කොටසක් 2021 ජූලි 16 දින ගිලා බැසීම හේතුවෙන් සිදුවී ඇති හානිය රු.මිලියන 100 කට අගය කර එය පූර්ණය කර ගැනීම සඳහා අදාල | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අතීත ක්‍රියාවලියක් මත වර්තමාන බැඳීමක් යටතේ වන ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි නීති අංශය මඟින් සපයා නොමැති වීම හේතුවෙන් අනාවරණයක් සිදුකොට නොමැත. | ගිණුම්කරණ ප්‍රමිති 37 ට අනුකූලව අසම්භාව්‍ය බැරකම් හඳුනාගෙන හෙළිදරව් කළ යුතු තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාගමට එරෙහිව අධිකාරිය විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණද ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 34 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි. | | |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 39 හි 58 ඡේදය ප්‍රකාරව සෑම ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදීම වත්කම් හානිකරණය වී ඇත්ද යන්න තක්සේරු කල යුතු වුවත් එසේ සිදු නොකර අනෙකුත් වත්කම්, ලැබිය යුතු දෑ හා තැන්පතු සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ ලෙස පිළිවෙලින් වාර්ෂිකව රු.200,000 ක්, රු.1,407,972 ක් හා රු.1,433,947 ක් වසර පහකට අධික කාලයක සිට ගිණුම්වලට ගැළපීම් කර තිබුණි. | මෙම වත්කම් වලට අදාළ හානිකරණ අලාභ හඳුනා ගැනීම ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති ලෙස වෙනස් කරන ලද අවස්ථාවේදී හඳුනාගෙන ඇති නමුත් එය වාර්ෂිකව ඇස්තමේන්තු කර නොතිබුණි. | ප්‍රමිතිය ප්‍රකාරව සෑම ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදීම වත්කම් හානිකරණය වී ඇත්ද යන්න තක්සේරු කර එය ගිණුම්වලට ගැළපිය යුතුය. |
| (උ) | අධිකාරිය විසින් රු.420,285,840ක් වැය කර ඉදිකල මැණික් කුළුණ ගොඩනැගිල්ලෙහි මහල් 03 ක පැවති කඩ කාමර 27ක් තිස් අවුරුදු බදු පදනම මත හා ආපනශාලාව කුලියට ලබා දීම සඳහා වෙන් කර තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ලෙහි වටිනාකම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 40 ප්‍රකාරව ආයෝජන දේපලක් ලෙස වාර්තා කිරීම වෙනුවට දේපල පිරියත හා උපකරණ යටතේ ගොඩනැගිල්ලක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කිරීම සඳහා අධ්‍යක්ෂ (මූල්‍ය) වෙත උපදෙස් ලබා දී ඇත. | ප්‍රමිති අංක 40 ට අනුව ගොඩනැගිල්ලෙහි වටිනාකම ආයෝජන දේපලක් ලෙස වාර්තා කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම ගිණුම්ගත කිරීමේදී රු.3,718,340 ක් වූ පොලී මත අයකළ රඳවාගැනීමේ බදු අඩුකර ආදායම හඳුනාගෙන තිබුණි. තවද, ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම රු.487,885,070 ක් | විගණනය විසින් බැංකු විස්තරයේ දක්වා ඇති දින ගණන පදනම් කරගෙන ලැබිය යුතු පොලී ආදායම ගණනය කර තිබීම මෙම වෙනසට හේතු වී ඇත.<br>ඉදිරියේදී ශේෂ තහවුරු කිරීම හා පොලී ආදායම් බැංකු විස්තර යන දෙකෙහිම අදාළ දිනයන් සලකා බලා | අලුත්කිරීමේ නිවේදන සහ අනෙකුත් උපලේඛන මත පදනම්ව නිවැරදිව පොලී ආදායම ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.397,810,120 ක් ලෙස රු.90,074,950 ක් අඩුවෙන්ද, මීට අදාල ලැබිය යුතු පොලී ආදායම රු.1,917,264 ක් අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි. | ලැබිය යුතු පොලී ආදායම ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | අධිකාරිය විසින් ප්‍රවර්තන වර්ෂය තුළ පවත්වන ලද ප්‍රදර්ශණ සඳහා ගෙවිය යුතු වියදම් නිශ්චිතව වගකීම් ලෙස හඳුනා නොගෙන එම වියදම් සඳහා රු.මිලියන 4 ක වෙන්කිරීමක් කර උපචිත වියදම් තුළ ඇතුලත් කර තිබුණි. | පවත්වන ලද ප්‍රදර්ශන සඳහා ගෙවිය යුතු වියදම් ලෙස නිශ්චිතව හඳුනාගැනීමට මූලාශ්‍ර ලේඛණ නොමැති වීම හා ගෙවීම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොමැති වීම මත අසම්භාව්‍ය බැරකමක් සේ සලකා රු. මිලියන 4 ක වෙන්කිරීම සිදුකරන ලදී. | වියදම් දැරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ නිසි අනුමැතිය මත සිදුවිය යුතු අතර ඒ සඳහා මූලාශ්‍ර ලේඛන ද පැවතිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රත්නපුර පැවති ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශණය සඳහා වැයකල රු.8,042,333 ක් වූ වියදම් බිල්පත් 04ක් සමාලෝචිත වර්ෂයේ වියදම් වලින් අත්හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අධිගණනය වී තිබුණි. | නිල උත්සව සමාගම වෙතින් සිදු කරන ලද අමතර කාර්යයන් සඳහා වන බිල්පත් 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම් අංශය වෙත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ඉදිරිපත් වී නොතිබීම හේතුවෙන් මෙම වියදම උපචිත වියදම් ලෙස හඳුනා නොගන්නා ලදි. | වර්ෂයට අදාල සියළු වියදම් මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | වැටලීම් සඳහා ත්‍යාගලාභීන්ට ගෙවිය යුතු රු.70,922,416 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස පෙන්වීම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හිමිකම් යටතේ මැණික් ත්‍යාග අරමුදල ලෙස දක්වා තිබුණි. | අධිකාරියේ ප්‍රධාන අරමුදල තුල පවතින ශේෂයක් බැවින් ත්‍යාග අරමුදල රු.70,922,416 ක් මූල්‍ය ප්‍රකාශනවල හිමිකමක් ලෙස හඳුනාගෙන ඇත. භාණ්ඩාගාරයෙන් ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස හඳුනාගන්නා තෙක් හිමිකමක් ලෙස ගිණුම් ගත කර ඇත. | හිමිකම් යටතේ දැක්විය යුත්තේ හිමිකරුවන්ගේ අයිතිය දැක්වෙන අගයන් පමණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන තුල වගකීම් ලෙස පෙන්විය යුතු අයිතම හිමිකම් යටතේ නොදැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රවර්ථන වර්ෂයේ ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලච්ඡේදයට අදාලව ගෙවිය යුතු VAT මුදල වූ රු.5,287,497 2025 ජනවාරි 20 දින ගෙවා තිබුණු නමුත් 2024 වර්ෂය අවසානයේ ගෙවිය යුතු VAT අගය ලෙස රු.1,592,752 ක් දක්වා තිබීම හේතුවෙන් රු.3,694,745 ක වෙනසක් නිරීක්ෂණය විය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු උපදේශන කමිටුව මඟින් 2024 ජනවාරි 17 දින ලබාදුන් නියෝගයකට අනුව 2009 දෙසැම්බර් 31 දිනට පෙර කාලපරිච්ඡේදයට හිඟව පැවති රු.3,673,486 ක එකතු කළ අගය මත බදු මුදල ගෙවීම් කිරීමේදී VAT ලෙජර් ගිණුමට හර කර ඇති නමුත් VAT බදු පාලන ගිණුම තුළ අදාළ ගැළපීම සිදු නොවීම හේතුවෙන් ඉහත රු.3,694,745 ක වෙනස ඇති වී ඇත. 2025 වර්ෂයේදී VAT බදු ගෙවීමේදී VAT ලෙජර් ගිණුම නිවැරදි කරනු ලැබේ. | ගෙවිය යුතු VAT නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සියයට 10 ක රඳවා ගැනීම් බදු, බිම්පංගු තැන්පතු හා අත්තිකාරම්, ලද තැන්පතු හා අත්තිකාරම් යන අයිතමයන්ට අදාල පිලිවෙලින් රු.2,568,873 ක්, රු.144,099,070 ක්, රු.4,555,139 ක් හා රු.105,842 ක් වූ ශේෂ සඳහා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | රඳවා ගැනීම් බදු අතීත ශේෂයක් වන බැවින්ද ඒ සඳහා ප්‍රමාණවත් තොරතුරු අධිකාරිය සතුව නොමැති බැවින් ද වසර 15 ක් ගතවන තුරුත් ඒ සඳහා හිමිකම් පෑමක් සිදු වී නොතිබීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පදනම්ව කපා හැරීමට ඉදිරියේදී කටයුතු සිදුකරනු ලැබේ. අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙන් වෙන් වශයෙන් පවත්වා ගෙන යන බිම්පංගු ලේඛන පරීක්ෂාවෙන් එම ශේෂ ලබාගත හැක. ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ආරක්ෂක තැන්පතු හා කුලී තැන්පතු සම්බන්ධයෙන් තැන්පතු ලේඛනයක් පවතින අතර එය ලෙජර් ගිණුම සමඟ සන්සන්දනය කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලේඛන හා ලෙජර් ගිණුම් සන්සන්දනය කර නිවැරදි වටිනාකම් සහිතව ගිණුම් පවත්වා ගෙනයා යුතු අතර එම උප ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට කඩ කාමර ලබාදීම සඳහා අධිකාරිය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථාන සමාගම අතර ඇති කරගෙන තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුණ ද, අධිකාරිය විසින් 2004 - 2018 කාලය තුළ සමාගමට වරින් වර ගෙවා තිබූ ආරක්ෂිත ඇප තැන්පතු රු.4,314,837 ක් නැවත අය කරගෙන නොතිබුණි. | ආරක්ෂිත ඇප තැන්පතු අඩුකොට ඇති කඩ හිමියන්ගෙන් කුලී වටිනාකම නැවත අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2025 වසරේ කටයුතු කරනු ඇත. | ආරක්ෂිත ඇප තැන්පතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට විවිධ ණය හිමි ශේෂය වූ රු.353,379,225 තුළ වසර 04 ඉක්මවූ රු.186,760,140 ක ශේෂයක් සහ සියයට 10 රඳවා ගැනීම් තුළ 2009 වසරට පෙර සිට පවතින රු.2,568,872 ක ශේෂයක් නිරවුල් වීමකින් තොරව පැවතුණි. | විවිධ ණයහිමි ශේෂය තුල පවතින වසර 04 ක් ඉක්මවූ රු.186,760,140 ක ශේෂය තුල ඉඩම් වෙන්දේසි තුලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු මුදලක් පවතින අතර මේ සම්බන්ධයෙන් උසාවියේ නඩුවක් විභාග වන බැවින් එහි තීන්දුව ලැබෙන තෙක් එලෙස ණයහිමි ශේෂය තුල දක්වා ඇත. නිරවුල් නොවී පවතින සියයට 10 රඳවාගැනීමේ ශේෂය රු.2,568,872 සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ඉදිරියේදී කටයුතු සිදුකරනු ඇත. | ගෙවිය යුතු ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලද තැන්පතු හා අත්තිකාරම් හි ටෙන්ඩර් තැන්පතු යටතේ ඇති රු.11,168,580 ක් වූ වටිනාකම තුල තැන්පතු පිළිබඳව තොරතුරු නිශ්චිතව වාර්තාකර නොමැති වසර 10 ට වැඩි එකතුව රු.1,842,675 ක් වටිනා තැන්පතු 130 ක් පැවතුණි. | 2008 වර්ෂයේ සිට මේ දක්වා රඳවාගෙන තිබෙන හිමිකම් නොපාන ලද ටෙන්ඩර් තැන්පතු මීට ඇතුලත් වන අතර තොරතුරු ප්‍රමාණවත් නොවීම මත මෙම තැන්පතු මේ දක්වා නිදහස් කිරීමට නොහැකි වී ඇත. | ගෙවිය යුතු තැන්පතු ශේෂ පිලිබඳ සොයාබලා කඩිනමින් නිරවුල් කිරීමට හෝ තොරතුරු නැති ශේෂ අදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත | | | |
| (i) 14(1)ඊ වගන්තිය | නීති විරෝධී මැණික් ගැරීම, නීති විරෝධී ලෙස මැණික් ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීමට අධිකාරිය ක්‍රියාත්මක විය යුතු වුවද, අධිකාරියේ මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය විසින් 2024 වර්ෂයේ සිදු කළ වැටලීම් අවස්ථා 38 කදී බලපත්‍ර ලබා නොගෙන ටිපර් රථ යොදා ගනිමින් ඉල්ලම් ප්‍රවාහනය, අනවසරයෙන් රජයේ ඉඩම් වල පතල් කැණීම හා ගඟ රක්ෂිතයට හානි වන ලෙස පතල් කැණීම සිදු කර තිබුණි. තවද අවස්ථා 46 කදී බලපත්‍ර කොන්දේසි කඩකර තිබුණ ද පරිසරයට අහිතකර ලෙස හා අවදානම් සහගත ලෙස සිදුවන නීතිවිරෝධි පතල් කැණීම් හා මැණික් ගැරීම් වැලැක්වීමට දඩ මුදල් අය කිරීම හැර වෙනත් නෛතික ක්‍රියාමාර්ග කෙරෙහි අධිකාරිය අවධානය යොමු කර නොතිබුණි. | මෙම කර්මාන්තය ලංකාව තුල ස්ථාපිත වී ඇති ස්වාභාවය අනුව අනවසර ගැරීම් / කැණීම් නිරන්තරයෙන් සිදු වන අතර එය මුළුමනින්ම නැවැත්වීම අපහසු වේ. කෙසේ වෙතත් මෙබඳු වැරදි කරුවන් හට අධිකාරිය පනතින් පැවරී ඇති සමථ කිරීමේ බලය ප්‍රකාරව කටයුතු කිරීම අනුගමනය කෙරෙන සාමාන්‍ය රාජකාරී ස්වාභාවය වේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව නීති විරෝධී මැණික් ගැරීම් වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) 15(1) වගන්තිය | මැණික් කර්මාන්ත විෂයට අදාළ ප්‍රධාන නියාමන අධිකාරිය තුන්වන පාර්ශවය සමඟ ඍජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලීම පනතේ 15(1) වගන්තියට පටහැනි බවට 2019 මාර්තු 25 දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් | මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් තෙවන පාර්ශවයන් සමඟ ගිවිසුම් ගත වීම එනම් මැණික් ගැරීම් ව්‍යාපෘතිවල නියැලීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් අවස්ථා කිහිපයක දී විවිධ | පනතේ විධිවිධාන ප්‍රකාරව මැණික් ගැරීම් ව්‍යාපෘති සිදු නොකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දී තිබුණ ද මැණික් ගැරීම් ව්‍යාපෘති සිදුකිරීම සම්බන්ධව අවසන් තීරණයක් ගෙන නොතිබුණි. | මත ඉදිරිපත් කොට ඇති අතර 2024 පෙබරවාරි දිනැති නීතිපති උපදෙස් අනුව අධිකාරිය සෘජුවම මැණික් ගැරීමේ ක්‍රියාවලියෙහි නොයෙදෙන්නේ නම් ලැබෙන මැණික් වලින් රාජ්‍යභාගය අය කිරීම සම්බන්ධව තෙවන පාර්ශවය සමඟ ගිවිසුම් වලට එළඹීම බාධාවක් නොවන බව සඳහන්ව ඇත.<br><br>උක්ත කරුණ සම්බන්ධයෙන් CA(Writ)694/2023 අංක යටතේ අධිකරණයේ නඩුවක් ක්‍රියාත්මක වන අතර ඉහත කී නීති උපදේශයද ඉවත් කර ගන්නා ලෙස අමාත්‍යාංශය වෙත දන්වා ඇත.<br><br>ඒ අනුව මේ වන විට වෙන්දේසියෙන් බැහැරව මැණික් ගැරීමේ අයිතිය පැවරීමක් සිදු නොකරන අතර ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති ද අවසන් කර ඇත. | |
| (iii) | 15(2) වගන්තිය | මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි. | පෞද්ගලික රසායනාගාර වර්ගීකරණය කිරීමේ නිර්ණායක 2025 මැයි 30 වන දින නීති අංශය වෙත යොමු කර ඇත. එකී වර්ගීකරණ නිර්ණායකයන් සම්බන්ධයෙන් අදාළ විෂය පිළිබඳ විශේෂඥ අදහස් හා අංශ ප්‍රධානීන්ගේ අදහස් සලකා බලා කඩිනමින් අවසන් කෙටුම්පත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව මැණික් පරීක්ෂා කිරීම සහ සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | 20(1) වගන්තිය | අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් හා පරිත්‍යාග අධිකාරියේ අරමුදලට බැර කළ යුතු බවත්, තෑගි මුදල් ගෙවීම එම අරමුදල භාවිත කරමින් සිදු කළ යුතු බවත් දක්වා තිබුණ ද ඉල්ලම් වෙන්දේසි කිරීමේදී ලැබෙන මුදල් සහ අධිකාරිය විසින් නියම කරන ලද දඩ මුදල් බැර කිරීම සඳහා ත්‍යාග අරමුදල නම් අරමුදලක් ද, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා වීමට ගතයුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම සඳහා මැණික් ගැරීම් සුභසාධන අරමුදල නම් අරමුදලක්ද, ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගේ තාක්ෂණික සංවර්ධනය උදෙසා ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල නම් අරමුදලක්ද වශයෙන් අරමුදල් 03 ක් ස්ථාපිත කර තිබුණි. ප්‍රධාන අරමුදලට අතිරේකව අරමුදලක් පවත්වා ගෙන යයි නම් භාණ්ඩාගාර අනුමැතිය මත සිදු කල යුතු නමුත් එවන් අනුමැතියකින් තොරව 2024 දෙසැම්බර් 31 දිනට ත්‍යාග අරමුදලේ රු.70,922,416 ක ශේෂයක්ද, මැණික් ගැරීම් සුභ සාධක අරමුදලේ රු.40,741,334 ක ශේෂයක්ද, ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලේ රු.101,455,508 ක ශේෂයක් ද, සහිතව පවත්වාගෙන ගොස් තිබුණි. | අධිකාරිය මඟින් පවත්වාගෙන යනු ලබන ත්‍යාග මුදල් ගෙවීම සඳහා වන වෙන්කිරීම සහ පතල්කරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් සිදුකරනු ලබන වෙන්කිරීම අරමුදල් නොවන බැවින් ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබාගෙන නොමැත. ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල 2006 අයවැය යෝජනාවකට අනුව භාණ්ඩාගාර අනුමැතිය යටතේ පවත්වාගෙන යනු ලබයි. | පනතේ විධිවිධාන ප්‍රකාරව ලැබෙන මුදල් අධිකාරියේ අරමුදලට බැර කිරීමට කටයුතු කල යුතුය. අරමුදල් පවත්වාගෙන යන්නේ නම් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය අදායම් පනතේ 86 වගන්තිය සහ දේශීය ආදායම් | i. සෑම රඳවා ගැනීම් අනුනියෝජිතයකු විසින්ම එකතු කළ රඳවා ගැනීම් බදු එක් එක් ලිත් මාසය අවසාන වී දින 15ක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් | සියයට 2.5 රඳවා ගැනීමේ බදු සඳහා වන ලිපිලේඛණ සම්පූර්ණ වීමත් හා ලෙජරය සමග සංසන්දනය කොට ලැබීම් තහවුරු කර ගැනීමෙන් අනතුරුව ගෙවීම් | දේශීය අදායම් පනත ප්‍රකාරව රඳවා ගැනීම් බදු ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. මීට අදාළ නොසැලකිල්ලක් |

| | | | | |
|---|---|---|---|---|
| | කොමසාරිස් ගේ අංක SEC/2022/E/03 හා 2022 දෙසැම්බර් 23 දරන රඳවා ගැනීම් අනු නියෝජිතයන් වෙත නිකුත් කළ රඳවා ගැනීම් බද්ද සහ අත්තිකාරම් බදු අඩුකිරීම් චක්‍රලේඛයේ අංක 06 ඡේදය | ජනරාල්වරයාට ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා රැස්කරන ලද රු.513,495,637 ක් හා 2024 වර්ෂයට පෙර රැස් කරගත් රු.491,428,327 ක් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | කඩිනම් කිරීමට කටයුතු කර ඇත. මෙලෙස ලැබීම් නිසි පරිදි තහවුරු කර ගැනීම සඳහා ගිණුම් අංශයේ කාර්ය මණ්ඩල ඌණතාවය හේතු වූ අතර ඉදිරියේදී බදු මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | පවතීද යන්න නිසි පරීක්ෂණයක් මගින් තහවුරු කරගත යුතුය. |
| | | ii. සෑම රඳවා ගැනීමේ අනුනියෝජිතයෙකු විසින්ම රඳවා ගැනීමේ බදු වාර්ෂික ප්‍රකාශනය බදු වර්ෂය අවසන් වී මාසයක් ( දින 30) තුල එනම් අප්‍රේල් 30 දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | රඳවා ගැනීමේ බදු වාර්ෂික ප්‍රකාශන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත 2025 මැයි මස 05 දින ඉදිරිපත් කොට ඇත. | දේශීය අදායම් බදු පනත ප්‍රකාරව රඳවා ගැනීමේ බදු වාර්ෂික ප්‍රකාශනය බදු වර්ෂය අවසන් වී මාසයක් තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 අගෝස්තු 29 දිනැති අංක NGJA/16.2/2018/Bachoe III දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ<br>(i) 07 ඡේදය | මැණික් ගැරීමෙන් පසු භූමිය යථාවත් කිරීම කළ යුතු වන අතර, එසේ නොමැතිව අනතුරුදායක සහ පරිසරයට හානිකර ආකාරයට අතහැර දමා ඇති අවදානම් සහගත පතල් වලවල්, බලපත්‍රය අවලංගු වී මාස 02 කින් පසුව අධිකාරිය විසින් වසා දමා භූමිය යථාවත්කල යුතු වේ. මෙම පතල් භූමි ප්‍රතිසංස්කරණ සඳහා අධිකාරිය තැන්පතුවක් ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම තැන්පතු ගිණුමේ රු.1,760,351,594ක ශේෂයක් පැවතුණි. එසේ වුවද, මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න පිළිබඳව අධිකාරිය නිසි නියාමනයක් හෝ අධිකාරිය විසින් පතල් භූමි ප්‍රතිසංස්කරණය සඳහා විධිමත් සැලසුමක් සහිතව කටයුතු සිදු කර හෝ නොතිබුණි. නියැදි | වසර 10 ට වඩා පැරණි පතල් සම්බන්ධව කටයුතු කිරීම සඳහා NGJA/17.1/COPE/23/24 දරණ ලිපිය මගින් නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන ඇත. එම වාර්තාව අනුව මෙම ප්‍රදේශයේ වසර ගණනාවක් පුරා සංවර්ධනය වූ ස්වාභාවික පාරිසරික පද්ධතියක් පවතින බැවින් නිසි පාරිසරික ඇගයීමක් සිදුකොට එකී පාරිසරික පද්ධතිය ඒ ආකාරයෙන්ම සංරක්ෂණය කිරීම හෝ එම වලවල් වසා දැමීම හෝ වෙනත් ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදවාගැනීම සුදුසු බවට එම වාර්තාවෙන් නිර්දේශ ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පරීක්ෂණයකින් අනාවරණය වූ පරිදි පතල් වලවල් 16ක් 2025 මැයි දක්වා වසා දමා නොතිබූ අතර මෙම පතල් වලවල් වසර 10කට පමණ පෙර මැණික් ගැරීමට අමතරව විවිධ කාර්යයන් සඳහා (වැලි/ පස් කැනීම) යොදා ගත් ඉඩම් වූ අතර, බලපත්‍ර ලබාගත් නිශ්චිත පුද්ගලයන් පිළිබඳ විස්තර ද අධිකාරිය සතුව නොතිබුණි. | | |
| (ii) | 04 හා 05 ඡේද | මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපොළ වටිනාකම දැක්වෙන ලේඛනය සෑම මාස 03 කට වරක් වැඩ කරන පළමු දින යාවත්කාලීන කරමින් අධිකාරියේ වෙබ් අඩවියේ පළ කළයුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. ඒ හේතුවෙන් මැණික් හා ස්වර්ණාභරණ තොග පරීක්ෂාකර වෙළඳපොළ වටිනාකම සමඟ සසඳා බැලීමට හා චක්‍රලේඛයෙහි අංක 6, 7, 8, 9, 10 ඡේදවල සඳහන් පරිදි ඉන්වොයිසියේ වටිනාකම වෙළඳපොළ වටිනාකමට වඩා වෙනස් වන විට අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට නොහැකි වී තිබුණි. | මැණික ගල්වල වෙළෙඳපොල වටිනාකම දැක්වෙන ලේඛණයක් අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇති නමුත් එය ත්‍රෛමාසිකව යාවත්කාලීන වී නොමැත. නෛතික පියවර ගැනීමට අදාළ චක්‍රලේඛය ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කළ යුතු බැවින් චක්‍රලේඛයේ 6,7,8,9,10 වගන්ති ප්‍රකාරව කටයුතු කිරීම සිදු කර නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව වෙළඳපොල වටිනාකම දැක්වෙන ලේඛනයක් වෙබ් අඩවියේ පල කර යාවත්කාලින කළ යුතුය. |
| (iii) | 07(i) ඡේදය | මැණික් අපනයනකරුවන්ගේ ඉන්වොයිස් වටිනාකම හා තක්සේරු වටිනාකම අතර සියයට 30 දක්වා වන වෙනස්කම් සංශෝධනය නොකර අපනයනය කිරීමට අනුමැතිය දී තිබීම හේතුවෙන් වැඩිවෙන ඉන්වොයිස් වටිනාකමට අදාල සේවා ගාස්තු ආදායම් අධිකාරියට අහිමි වී තිබුණි. මැණික්වල සත්‍ය විකුණුම් වටිනාකමට වඩා ඉන්වොයිසියේ සඳහන් වටිනාකම පමණක් | ජාත්‍යන්තරය තුල මැණික් සඳහා නිශ්චිත මිලක් නොමැති බැවින් ආසන්න වශයෙන් සියයට 70 ක මිල ගැලපුමක් සැලකිල්ලට ගනු ලබන අතර සියයට 30 ක උච්චාවචනයක් සඳහා අවස්ථාව ලබා දී ඇත. නමුත් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් නැවත සලකා බලා මෙම ප්‍රතිශතය වෙළෙඳපොල මිල සංශෝධනය කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව | අභ්‍යන්තර චක්‍රලේඛය අවශ්‍ය පරිදි සංශෝධනයට ලක් කළ යුතුය. |

| | |
|---|---|
| අපනයනවලින් ලද ආදායම ලෙස ප්‍රේෂණය කිරීමේ ප්‍රවනතාවයක් අපනයනකරුවන් තුළ පවතින පසුබිමක විශාල වටිනාකම් සහිත අපනයනවල ඉන්වොයිස් වටිනාකම උක්ත අනුමැතිය මත වෙනස් නොකිරීම තුළ රට තුලට ප්‍රේෂණය වන විදේශ විනිමය ප්‍රමාණය අඩු වන තත්ත්වයක් පැවැතුණි. | මෙම අභ්‍යන්තර චක්‍රලේඛය යාවත්කාලීන කිරීමට නියමිතය. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.607,576,727ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.995,430,030 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.387,853,303 ක පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීමට ආදායම හා ශුද්ධ මූල්‍ය ආදායම එකතු වටිනාකම රු.443,099,018 කින් අඩු වී තිබීමත් වෙනත් ආදායම් රු.110,809,088 කින් වැඩිවීමට සාපේක්ෂව පරිපාලන වියදම්, පුද්ගල වැටුප් වේතන හා ප්‍රවර්ධන වියදම් එකතු වටිනාකම් රු.55,563,372 කින් වැඩි වීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත 1993 වර්ෂයේ අනුමත කර ගැනීමෙන් පසුව එය කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි. | අංක අමප/23/1392/617/029 සහ 2023 අගෝස්තු 15 දිනැති කැබිනට් තීරණය අනුව 1993 අංක 50 දරන පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවක් නොමැති බවට දන්වා එවා තිබූ බැවින් නැවත එකී පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලුම් කර තිබේ. | කාලානුරූපීව පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රේගුව හරහා 2022, 2023 සහ 2024 වර්ෂ තුන තුළ රු.2,091,693,980 ක් වටිනා මැණික් කිලෝ ග්‍රෑම් 46,815.94 ක් ආනයනය කර තිබුණු අතර, ඊට අදාලව සමාජ ආරක්ෂණ බද්ද රු.15,614,849 ක් ද, එකතු කළ අගය මත බදු රු.38,616,009 ක්ද, 2024 වර්ෂයේදී අය වී තිබුණි. මෙම වසර | මෙම කර්මාන්තය නියාමනය කිරීම සඳහා සියළු මැණික් පාෂාණ ආනයනය කිරීම සම්බන්ධයෙන් තොරතුරු අධිකාරිය වෙත ලබා ගත යුතු බැවින් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් | ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සමඟ එක්ව ආනයනය කරනු ලබන මැණික් සම්බන්ධයෙන් නියාමන |

| | | | |
|---|---|---|---|
| | තුන තුළදී රු.22,523,409 ක් වටිනා මැණික් කිලෝ ග්‍රෑම් 1,664.06 ක් පමණක් රු.10,723,623 ක අගයක් එකතු කර අධිකාරිය හරහා ප්‍රති අපනයනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂවලදී සමස්ථ මැණික් ආනයන පිළිබඳව තොරතුරු ආයතනය සතුව නොතිබූ අතර ආනයන පිළිබඳව නියාමන ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර ද නොතිබුණි. | කිරීමට සැලසුම් කර ඇත. | ක්‍රමවේදයක් සකස් කල යුතු අතර අගය එකතු කර ප්‍රතිඅපනයනය දිරිගැන්වීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | මැණික් ගල් තාපකරණයට ලක් කර තිබේද නැත්ද යන්න හදුනා ගැනීම සඳහා පිරිවැය එකතුව රු.16,379,110 ක් වූ FTIR යන්ත්‍ර දෙකක් රත්නපුර කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය සඳහා 2013 හා 2020 වර්ෂවල මිලට ගෙන තිබුණු අතර, යන්ත්‍ර මිලදීගත් දින සිට 2025 මාර්තු මාසය දක්වා සහතික පත් 07 ක් පමණක් නිකුත් කර තිබුණි. 2020 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍රයේ මිලදී ගැනීම් ගිවිසුම අනුව නිෂ්පාදිත ආයතනය විසින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා ලබා දීමට එකඟ වී ඇති විදේශ පුහුණුව වසර 05 ක් ගත වී ඇතත් මේ දක්වා ලබාගෙන නොතිබුණු අතර, මෙම යන්ත්‍ර සඳහා සේවා ගිවිසුම්වලට ද එළඹ නොතිබුණි. වර්තමානය වනවිට යන්ත්‍ර නිසි ලෙස ක්‍රියාකරවීමට පුහුණු ශ්‍රමිකයන් හා දත්ත ගොනු නොමැති වීම නිසා යන්ත්‍ර උපරිම කාර්යක්ෂමතාවයෙන් ක්‍රියාත්මකව නොතිබුණි. | කොළඹ ප්‍රධාන කාර්යාලය හා රත්නපුර මැණික් පරීක්ෂණාගාර සඳහා පිලිවෙලින් 2020 හා 2013 වර්ෂවල මිලදීගත් FTIR යන්ත්‍ර දෙකම මේ වන විට ක්‍රියාකාරී තත්වයට ගෙන ඇති නමුත්, කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතින FTIR යන්ත්‍රයේ අදාල දත්ත ගොනු (Data base) ප්‍රමාණවත් නොවීමත් පුහුණුව මදිකමත් යන හේතු නිසා දැනට සහතික පත්‍ර නිකුත් කිරීම සිදු නොවේ. රත්නපුර ස්ථාපිත FTIR යන්ත්‍රය ක්‍රියාකිරීම සඳහා එහි කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබාදීමට මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සහයෝගය ලබාදෙන අතර, ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | වත්කම් නිසි ක්‍රියාකාරී තත්වයෙන් පවත්වා ගනිමින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ යුතුය. |
| (ඈ) | අධිකාරිය සතුව පවතින වටිනා ලෝහ විශ්ලේෂණය කිරීම සහ මුද්‍රා තැබීම සඳහා යොදාගනු ලබන Lesser Marking යන්ත්‍ර 06 ම 2024 මාර්තු 15 දින වන විට අක්‍රිය වී තිබීම මත එදින සිට Manual Hallmarking පමණක් සිදුවන අතර විගණිත දිනය වූ 2025 මැයි 28 දින දක්වාම එම යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට නොහැකි වී තිබුණි. පිරිවැය රු.52,540,888 ක් වූ ඵලදායි ජීවකාලය අවසන් වී නොමැති මෙම යන්ත්‍ර 06 අලුත්වැඩියාවන් හා සේවා කිරීම් සම්බන්ධයෙන් ගිවිසුම් ගතවී ද නොතිබූ අතර මේ හේතුවෙන් යන්ත්‍ර භාවිතයෙන් තොරව අක්‍රියව තැබීමට සිදුවී තිබුණි. තවද | 2015දී මිලදී ගත් SISMA EASY 100 උපකරණ 01ක් 2018 වසරේදී හා අනිත් SISMA EASY 100 උපකරණය 2022 ඔක්තෝබර් 28 දින අක්‍රිය විය. 2015දී මිලදී ගත් 200F උපකරණ 02 ක් 2023 වසර අග අක්‍රීය විය. 2021 වසරේ මිලදී ගත් යන්ත්‍ර 02 ක් 2024 පෙබරවාරි සහ 2024 මාර්තු වලදී යම් යම් දෝෂ තත්ත්වයන් ඇති වී ලේසර් කිරණ නිපදවීම අක්‍රීය විය. මේ අවස්ථාවලදී දේශීය නියෝජිත ආයතනය මාර්ගගත ක්‍රමය ඔස්සේ මව් සමාගම සම්බන්ධ වී | වත්කම් නිසි ක්‍රියාකාරී තත්වයෙන් පවත්වා ගනිමින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2020 වර්ෂයේ මිලදී ගත් Lesser Marking යන්ත්‍ර දෙක මිලදී ගැනීමේ ගිවිසුම අනුව නිලධාරීන් දෙදෙනකු වෙත නිෂ්පාදන සමාගම විසින් ලබා දීමට එකඟ වී ඇති විදේශීය පුහුණුව වසර 04 ක් ගතවී ඇතත් අධිකාරියේ නිලධාරීන් සඳහා ලබා ගැනීමට කටයුතු නොකර අදාල යන්ත්‍රය මිලදී ගැනීමේ බිල්පත තුළ ඇතුළත් රු.900,000 ක නිලධාරීන් පුහුණු කිරීමේ පිරිවැය 2025 පෙබරවාරි 27 දින නැවත අය කර ගෙන තිබුණි. | අළුත්වැඩියා කිරීමට කිහිපවිටක්ම උත්සහ කළ නමුත් එය අසාර්ථක විය.<br><br>මෙම යන්ත්‍ර නැවත අළුත්වැඩියා කිරීම පිරිවැය අධික කටයුත්තක් වන බැවින් අඩු පිරිවැයක් යටතේ චීනයේ හෝ ඉන්දියාවේ නිෂ්පාදිත නව ලේසර් යන්ත්‍ර 03ක් මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.<br><br>2024 මාර්තු මස 15 දින සිට මෙම මුද්‍රා තැබීමේ සේවාව යන්ත්‍ර භාවිතයෙන් තොරව නොකඩවා (Hand Marking) පවත්වාගෙන යනු ලබයි. | |
| (ඉ) | අධිකාරිය විසින් ජාත්‍යන්තර මැණික් වෙළඳ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ඉදිකරන ලද මැණික් කුළුණ ගොඩනැගිල්ලෙහි අවුරුදු 30ක බදු පදනම මත ලබා දීමට යෝජිත කඩ සාප්පු 27න් සාප්පු 14 ක් පමණක් බදු දී තිබූ අතර ඉතිරි කඩ සාප්පු 13 හා ආපනශාලාව වසරක කාලයක් තිස්සේ ඌන උපයෝජිතව පැවතුණි. බදු පදනම මත ලබා දී තිබූ කඩ කාමර 05 කට අදාලව 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.2,179,890 ක කුලී මුදලක් හිඟව පැවතුණි. මේ හේතුවෙන් එක් කඩ කාමරයක් නැවත අධිකාරිය වෙත පවරා දී තිබූ අතර කඩසාප්පු 04 ක් මුද්‍රා තැබීමට නියමිතව තිබුණි. බදු පදනම මත ලබා දී තිබූ කඩ සාප්පු 04ක් වෙන්දේසි කිරීමේදී මුදල් ගෙවා වෙන් කර ගැනීමෙන් පසුව ගිවිසුම්ගත වීමට මාස 08 ක පමණ කාලයක් ගත වීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට උපයා ගැනීමට හැකිව තිබූ රු.1,250,000 ක ආදායමක් අධිකාරියට අහිමි වී තිබුණි. | මැණික් කුළුණෙහි ස්ථාපිත ආපන ශාලාව අවස්ථා 03 කදී මිල කැඳවීමට කටයුතු කර ඇති නමුත් ඒ සඳහා කිසිදු ගැණුම්කරුවකු ඉදිරිපත් වී නොමැත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විදේශිකයින්ට වෙන්කර තිබූ කඩ කාමර 10 ද දේශීය වශයෙන් අලෙවි කිරීමට 2025 මැයි 07 දින කඩ කාමර 13 ක් සඳහා ටෙන්ඩර් කැඳවීම සිදු කලද ඉන් එක කඩකාමරයක් පමණක් අලෙවි වී ඇත. සාප්පු අංක 02 නැවත ටෙන්ඩර් කිරීමට සහ සාප්පු අංක 02 හිඟ මුදල් නැවත අයකර ගැනීමටත් සාප්පු අංක 04, 09, 13, 21 සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව මුද්‍රා තබා හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ගිවිසුම් ප්‍රකාරව බදු කුලී නොගෙවන කඩ කාමර සම්බන්ධයෙන් හිඟ කුලී අයකර ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට තීරණය කර ඇත. | ව්‍යාපාරික අරමුණින් ඉදිකළ කඩ සාප්පු සැලසුම්ගත පරිදි නිසි ආදායම් උපයා ගැනීමට හැකිවන ලෙස බදු දීමට කටයුතු කර කඩ සාප්පු ඌන උපයෝජිතව පැවතීම වලක්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මැණික් සහිත ප්‍රදේශ අනවසර මැණික් ගැරීම්වලින් වළක්වා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කර නිත්‍යානුකූලව මැණික් ඉවත් කිරීමට අපේක්ෂා කර කුඹුක්කන් ඔය ආශ්‍රිත ජලාශයට යටවන භූමියේ පර්යේෂණ නියමු පතල් කැනීම් ව්‍යාපෘතියක් සිදු කිරීමට අධිකාරිය විසින් රු.5,757,000 ක ඇස්තමේන්තුවක් සකස් කර රු.750,000 ක් 2021 වර්ෂයේදී වැයකර තිබුණි. මෙහිදී කැරට් 600 ක පමණ මැණික් හමුවී තිබූ අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී නොමැති වීමෙන් ඉදිරි කටයුතු නතර වී තිබුණි. අධිකාරිය විසින් සිදු කරන ලද පර්යේෂණවල දත්ත අනුව දළ වශයෙන් රු.බිලියන 10 ක පමණ මැණික් පැවතීමේ ශක්‍යතාව මත ව්‍යාපෘතිය සඳහා එකඟතාව ලබා දෙන ලෙස නැවතත් අධිකාරිය විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත 2024 අප්‍රේල් 19 දින ඉල්ලීම් කර තිබූ නමුත් එයට ප්‍රතිචාර ලැබී නොමැති අතර මේ වන විටත් එම ඉඩමේ අනවසර කැනීම් සිදුවෙමින් පැවතුණි. | මොණරාගල කුඹුක්කන් ඔය යෝජිත ජලාශ ව්‍යාපෘතිය සඳහා යටවීමට නියමිත භූමිය බලපත්‍ර සහිත පතල් ක්‍රියාත්මකව පැවති ප්‍රදේශයක් වන අතර අනවසර මැණික් ගැරීම් ද විශේෂයෙන් කුඹුක්කන් ඔය ආශ්‍රිතව බහුලව පවතින ප්‍රදේශයකි. මැණික් විභවයකින් යුතු ප්‍රදේශ මෙහිදී හඳුනාගෙන ඇති අතර අවම බලපෑමක් යටතේ කැණීම් කොට මැණික් ඉවත් කර ගත හැකි ද්විතීක මැණික් ඉල්ලම් (Secondary Gem Deposits) සහිත ස්ථාන ද හඳුනාගෙන ඇත. කෙසේ වුවද වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් එකඟතාව නොලැබීම මත මෙම සම්පත් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කිරීම අවහිර වී ඇත. | අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා කර නිත්‍යානුකූලව මැණික් ඉවත් කර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැණික් බලපත්‍ර නිකුත් කිරීමේදී භාරනු ලබන මැණික් පතල් නැවත පුරවා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.4,500, රු.9,000 සහ යාන්ත්‍රික පතල් සඳහා වර්ග අඩි 3,000-40,000 ක් දක්වා ප්‍රමාණයක් සඳහා රු.600,000 සිට රු.5,000,000 ත් ලෙස විශේෂ ආරක්ෂණ ඇපයක් පතල් කරුවන්ගෙන් අයකරන අතර එම පතල් නැවත ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව එම ඇප තැන්පතු නැවත ඔවුන් වෙත ලබාදීම සිදුකරයි. පතල් තැම්පතු ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට මේ ආකාරයට එකතු වූ රු.1,760,351,594 ක මුදලක් පවතින අතර මෙම තැන්පතු පිළිබඳ උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එහි නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය. | ප්‍රාදේශීය කාර්යාල තුළ පවතින ඇප තැන්පතු ලේඛණය පරීක්ෂාව මඟින් පතල් ඇප තැන්පතු රු.1,760,351,594 සඳහා ශේෂ තහවුරුවක් ලබාගත හැකිය. වැඩ අවසන් කරන ලද පතල් සම්බන්ධයෙන් වන ඇප තැන්පතු අදාල පතල් වලවල් වැසීමෙන් අනතුරුව නිදහස් කරනු ලබන බැවින් මෙම ශේෂය තුල පවතින්නේ දැනට ක්‍රියාකාරී තත්වයේ පතල් සම්බන්ධයෙන් වන ඇප ශේෂයන් වේ. | තැන්පතු භාවිතයෙන් මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය වෙතින් පතල් කැණීම් බලපත්‍රය පහසුවෙන් ලබා ගත හැකි නිසා දීර්ඝ කාලයක් තිස්සේ වැලි කැණීම් සිදු කරන පිරිස විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙතින් වැලි කැණීම් බලපත්‍ර අයදුම් නොකර මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පතල් කැණීම් බලපත්‍රය උපයෝගී කරගනිමින් වැලි කැණීම් සිදු කර එම වැලි ඉවත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රවාහන බලපත්‍රය පමණක් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශයෙන් අධිකාරිය හරහා ඉල්ලුම් කරන බව ලේඛන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. නියැදි පරික්ෂාවේදී බලපත්‍ර අංක GML1020817 දරන පතල් හිමියා විසින් 2024 ජුලි 31 දින වන විට පතල් කැණීමේ හා ඉල්ලම් සේදීමේ අතුරු නිෂ්පාදන වශයෙන් වැලි කියුබ් 2,500ක් පමණ රැස් කර ඇති බැවින් එම වැලි ඉවත් කිරීමට අධිකාරියෙන් අනුමැතිය ඉල්ලා තිබුණද විගණිත දිනය වූ 2025 ජනවාරි 10 දින තෙක් ඒ සඳහා භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ අනුමැතිය ද ලැබී නොතිබුණි. | මැණික් කර්මාන්තය සිදු කිරීමේදී අතුරුඵලයක් ලෙස නිෂ්පාදනය වන වැලි පතල් වැසීමට ද බාධාවක් නොවන ලෙස නීත්‍යානුකූලව ඉවත් කර ගැනීම සම්බන්ධව පැවති ගැටලු විසඳා ගැනීමට භූ විද්‍යා හා පතල් කාර්යාංශය සහ අප අධිකාරිය සාකච්ඡා කර මේ වන විට අදාල නිර්ණායක සකසා පැවති ගැටලු අවම කිරීමට කටයුතු සිදු කොට ඇත. | නීත්‍යානුකූලව නිර්ණායක සකසා බලපත්‍රයෙහි කොන්දේසි ඉටු වන අයුරින් කටයුතු කිරීමත් වැලි ඉවත් කිරීම නීත්‍යානුකූල අයුරින් කටයුතු කිරීමටත් හැකිවන පරිදි කටයුතු මෙහෙයවීමටත් වගබලා ගත යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් කතරගම ප්‍රදේශය තුළ නිවාඩු නිකේතනයක් ඉදිකිරිමට 2016 වර්ෂයේ රු.2,444,580 ක් වැයකර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගත් පර්චස් 39.84 ක ඉඩම අදාල කාර්යය සඳහා භාවිතා නොකර වසර 09 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. එකී ඉඩම අනවසර පදිංචිකරුවන්ගේ බලපෑම් සහිත ඉඩමක් බව දෙපාර්ශවයම දැනුවත්ව සිටිය ද ඉඩම මිලදී ගැනීමට අධිකාරිය කටයුතු කර තිබුණු අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට නීතිමය ක්‍රියා මාර්ග ද ගෙන නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් ලබාදී ඇති උපදෙස් පරිදි අනවසර පදිංචිකරුවන්ට විරුද්ධව නීතිමය කටයුතු කිරීම සඳහා ඉල්ලා ඇති ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | ඉඩම මිලදී ගැනීමට පෙර අනවසර පදිංචිකරුවන් ඉවත් කර අනතුරුව මිලදී ගැනීමට කටයුතු නොකළ වග කිවයුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. මිලදීගත් ඉඩම අරමුණුගත කාර්යයට යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.889,000 ක් වූ බෙලිදෙණිය ඉඩම හා පිරිවැය රු.5,358,507 ක් වූ ගොඩනැගිල්ල වසර 12 කට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව විනාශ වෙමින් පැවතුණි. 2008 වර්ෂයේ බෙලිදෙණිය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට රු.3,147,501 ක් දරා තිබූ නමුත් වියදම දරන ලද වර්ෂයෙන් පසු 2024 දෙසැම්බර් 31 දින දක්වා ආසන්නව මාස 194 ක් තුල මාස 20 ක් පමණ කාලයක් කිසියම් කාර්යක් සඳහා භාවිත කර තිබූ නමුත් මාස 170 ක පමණ කාලයක් ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබූ අතර ප්‍රතිසංස්කරණය සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | මෙම ගොඩනැගිල්ල මැණික් සංස්ථාව විසින් ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා භාවිතා කර තිබූ අතර ස්වර්ණාභරණ නිෂ්පාදනය අධිකාරියේ කාර්යයක් නොවූ බැවින් මෙම මධ්‍යස්ථානය නිෂ්කාර්ය වී ඇත. එය තවදුරටත් නිෂ්කාර්ය වීම වැලැක්වීමේ අරමුණින් දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත මෙම ගොඩනැගිල්ල සහ ඉඩම නැවත පවරා දීම සිදු කරනු ලබයි. | නිෂ්කාර්ය වියදම් ඇති නොවන ලෙස ඉඩම ඵලදායී කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ අංග සම්පූර්ණ මැණික් රසායනාගාරයක් ඇති කිරීමේ අරමුණින් මැණික් අපනයන වටිනාකම මත අධිකාරිය අයකර ගන්නා 0.25% ක අපනයන සේවා ගාස්තුවට අමතරව 2001 වසරේ ජනවාරි සිට තවත් 0.25% ක අපනයන සේවා ගාස්තුවක් අපනයනකරුවන්ගෙන් අය කර ගෙන අධිකාරිය සහ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංගමය අතර ඇතිකර ගත් එකඟතාවයක් මත ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි නමින් සීමා සහිත පෞද්ගලික සමාගමක් 2008 මැයි මස 29 වන දින ස්ථාපිත කර තිබුණි. 2009 ජනවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ඉහත පරිදි එකතු කරගන්නා ලද රසායනාගාර සංවර්ධන අරමුදලේ එකතු වූ රු.92,498,578 ක මුදල 2009 අප්‍රේල් 27 දින උක්ත සමාගමේ ගිණුමට බැර කර තිබුණි. සමාගම ස්ථාපනය කර 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 16 ක් ඉක්මවා තිබුණ ද සමාගමේ අරමුණ වූ රසායනාගාරය පිහිටුවීම ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. සමාගමෙහි ගිණුමට බැර කරන ලද රු.92,498,578 ක මුදල හා ඊට අදාළ පොලිය අධිකාරියේ අරමුදලට නැවත මාරු කිරීමටත් එම | මෙම සමාගම සමාගම් පනත යටතේ පිහිටුවා ඇති පෞද්ගලික සමාගමක් වන බැවින් එහි අධ්‍යක්ෂකවරුන් ලෙස ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරින්ට ඔවුන්ගේ නිල මට්ටමින් කටයුතු කිරීමට 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ ප්‍රතිපාදන සලසා නොමැති බැවින් මෙම සමාගම ක්‍රියාත්මක වී නොමැති අතර ඒ තුල ආයෝජිත මුදල් ඌණ උපයෝජනය වී ඇත. මෙම මුදල් අධිකාරිය වෙත පවරාගෙන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත යටතේ ආයතනයක් ජාත්‍යන්තර මට්ටමේ රසායනාගාරයන් අතරට පත් කිරීම සඳහා 2016 අගෝස්තු 24 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා ගෙන ඇත. ඒ අනුව අදාළ මුදල් අධිකාරිය වෙත ලබා ගැනීම සඳහා මෙම සමාගම විසුරුවා හැරීම සිදු කල යුතු බැවින් ඒ සඳහා වන නීතිපති දෙපාර්තමේන්තුවේ | සමාගම නිත්‍යානුකූලව පවත්වාගැනීම තුළින් මැණික් රසායනාගාරයක් ස්ථාපිත කිරීම හරහා සමාගමේ ගිණුම්වල පවතින මුදල් ඵලදායි ලෙස යෙදවීමට හැකි වැඩපිළිවෙලක් කඩිනමින් සකස් කිරීමට හෝ සමාගම විසුරුවා හැරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අරමුදල් උපයෝගී කරගනිමින් යෝජිත ජාත්‍යන්තරව පිළිගත් උසස් තාක්ෂණික රත්න විද්‍යා රසායනාගාරයක් අධිකාරිය යටතේ ස්ථාපිත කිරීමටත් 2016 අගෝස්තු 24 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණ ද වර්ෂ 08 ක් ඉක්මවා තිබියදීත් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කර නොතිබුණි. සමාගමට අදාළව 2014/2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ලංකා බැංකුව විසින් තහවුරු කර ඇති පරිදි සමාගමේ ස්ථාවර තැන්පතුවේ 2024 දෙසැම්බර් 31 දිනට රු.251,134,797 ක ශේෂයක් පැවති අතර ජංගම ගිණුමේ රු.25,841,283 ක ශේෂයක් නිෂ්කාර්යව පැවතුණි. | නිර්දේශය 2024 අප්‍රේල් 22 දැනැති අංක E/142/23/NG & JA යටතේ අධිකාරිය වෙත යොමු කර ඇත. එකී නිර්දේශය මඟින් 2007 අංක 07 දරණ සමාගම් පනතේ 325 සිට 332 දක්වා වූ වගන්ති මඟින් ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට අධ්‍යක්ෂකවරුන් පත්කිරීමකින් තොරව කොටස් හිමියන්ගේ ස්වේච්ඡා ඈවර කිරීමක් සම්බන්ධයෙන් සලකා බලන ලෙසට උපදෙස් ලබා දී ඇත.<br>ඒ අනුව මෙම සමාගම විසින් විසුරුවා හැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් 2025 අප්‍රේල් 07 වන දින ශ්‍රී ලංකා මැණික් සංගමයේ නියෝජනය සහ අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් රැස්වීමක් පවත්වන ලද අතර එහිදී සමාගම විසුරුවා හැරීම හා වෙනස්කම් සහිතව නව සමාගමක් පිහිටුවීමට තීරණය කර තිබුණි. වර්තමානය වන විට සමාගමේ කටයුතු ක්‍රියාකාරී මට්ටමේ නොපවතින බැවින් මූල්‍ය ප්‍රකාශන සකස් කර නොමැත. | |
| (ඇ) | අධිකාරිය ආරම්භ කර තිබූ මැණික් ගැරීම් ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂය වන විට තාවකාලිකව නතර කර තිබූ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් රු.1,795,172 ක වියදමක් දරා තිබුණි. | කළුගඟ හැරණියාවක ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැහැදිලි නීතිපති උපදෙස් නොලැබීම මත 2025 මැයි මස මෙම ව්‍යාපෘති භූමියෙන් ඉවත් වීමට නැවත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කොට ඇත. ඉදිරියේදී සිදුවිය හැකි අනවසර මැණික් ගැරීම් වැටලීම් මඟින් පාලනය කිරීමටත් නියමිතව ඇති අතර අදාළ ගංඟා කොටස ප්‍රසිද්ධ වෙන්දේසි මඟින් බැහැර කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සකස් කරමින් පවතී. | නියාමන ආයතනයක් වශයෙන් මැණික් ගැරීම් සිදු නොකළ යුතු අතර නිෂ්කාර්ය වියදම් ඇති නොවීමට වග බලා ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය විසින් රු.මිලියන 19 ක පිරිවැයකට ආයතනයේ භාවිතය සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ මෘදුකාංග සැපයුම් ආයතනයක් සමඟ මාස 11 ක කාලයක් සඳහා ගිවිසුම් ගත වී 2024 වර්ෂය වන විට රු.10,925,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ප්‍රසම්පාදන කටයුතු සිදු කර වසර 08ක් ගතව තිබුණ ද 2024 දෙසැම්බර් 31 දින වන විටත් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම සාර්ථකව අවසන් කර නොතිබුණි. | මූලික පිරිවිතරයන්ට අදාල සම්පූර්ණ කොටස් සංවර්ධනය කර අවසන් කිරීමට මෘදුකාංග සංවර්ධන ආයතනය අපොහොසත් වී තිබුණි. තවදුරටත් එම ආයතනය වෙත සංවර්ධනය නොවූ කොටස් සංවර්ධනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙමින් මාස 09 ක කාලයක් ලබා දුන්නද එම කාලය තුල පිරිවිතරයන්ට අනුකූලව පරිඝනක පද්ධතිය සංවර්ධනය නොවීම හේතුවෙන් 2025 පෙබරවාරි 06 දින ලබා ගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෘදුකාංග ආයතනය වෙත ලිඛිතව දන්වමින් ගිවිසුමෙන් ඉවත්වීමට කටයුතු කරන ලදි. මෙම මෘදුකාංග පද්ධතිය නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා නව ආයතනයක් තෝරා ගැනීමට 2025 මාර්තු 25 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ මේ වන විට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. | ප්‍රසම්පාදන කාර්ය ක්‍රමානුකූලව සිදුකර තෝරාගත් ආයතනය සමඟ ප්‍රමාදයකින් තොරව කටයුතු කර මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කර අවසන් කර ගැනීමට වගබලා ගත යුතුය. |